# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/2 - 2015 ජුනි මස 08 වැනි සඳුදා - 2015.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වන වගන්තිය යටතේ වන නියෝග**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිර්දේශ මත, විදුලිබල හා බලශක්ති අමාත්‍ය චම්පික රණවක වන මවිසින් මෙහි පහත දක්වනු ලබන විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යය පටිපාටි) නියෝග සාදනු ලැබේ.

චම්පික රණවක,<br>
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2015 ජුනි මස 04 වැනි දින,

එල්.ඩී.බී. 3/2009.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 6 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 54 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශමත විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2015 ජුනි මස 04 වැනි දින,<br>
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2015 අංක ......... දරන විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්ය, කර්තව්‍ය හා කාර්ය පටිපාටි) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පාරිභෝගිකයකුගෙන් ලිඛිත ඉල්ලීමක් ලැබීමේ දී හෝ කොමිෂන් සභාවෙන් විධානයක් ලැබීමෙන් පසුව විදුලි පරීක්ෂකවරයකු විසින් පරිශ්‍රය සෝදිසි කර යම් විදුලි රැහැන් හෝ පිරියත හෝ විදුලි බලය සැපයුමක් පරීක්ෂා කර නියමිත කාර්යය දින දහයක් ඇතුළත ඉටුකරනු ලැබිය යුතු ය.


1A - G 21653 — 08 (2015/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. සෑම ඉල්ලීමක්ම සමග පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය :-

(අ) පරිශ්‍රයේ ලිපිනය ;
(ආ) ඉල්ලීමේ අරමුණ ;
(ඇ) රුපියල් දෙසිය පනහක් (රු.250/-) ගෙවූ රිසිට්පත.

4. පාරිභෝගිකයා විසින් එකඟ වූ පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා වූ ඕනෑම කාලයක් තුළ දී විදුලි පරීක්ෂකවරයාට අදාළ පරිශ්‍රය වෙත ඇතුල් විය හැකි ය.

5. කොමිෂන් සභාවේ විධානයක් ප්‍රකාරව විදුලි පරීක්ෂකවරයා විසින් අහඹු සෝදිසි කිරීමක් සහ පරීක්ෂණයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත බලය පැවරීම සමග ස්වකීය අනන්‍යතාවය ඉදිරිපත් කරමින් ඔහුගේ සෝදිසි කිරීම හා පරීක්ෂාව පිළිබඳ හේතු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. විදුලි පරීක්ෂකවරයකු විසින් විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම හෝ සැපයීම සඳහා වූ බලපත්‍රයක් මගින් බලය දී ඇත්තා වූ තැනැත්තන්ට හෝ එවැනි බලපත්‍රයක් ලබා ගැනීමේ නියමයෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තන්ට අයත්වන විදුලි රැහැන් සහ පිරියත පිළිබඳ සෝදිසි කිරීමක් හෝ පරීක්ෂාවක් සිදුකරන අවස්ථාවක දී, එම විදුලි රැහැන් සහ පිරියත අයත්වන තැනැත්තන් විසින් සියලු වාර්තා හෝ විමසා බැලීමට අවශ්‍යවන වෙනත් අදාළ තොරතුරු සපයනු ලැබිය යුතු අතර නිවැරදිභාවය පරීක්ෂා කිරීම සඳහා සියලු ප්‍රමිතිගත උපකරණ වෙත ප්‍රවේශවීමට අවස්ථාව ලබාදිය යුතු ය.

7. විදුලි පරීක්ෂකවරයකු විසින් සෝදිසි කිරීමක් හෝ පරීක්ෂණයක් පවත්වන අවස්ථාවක දී බලපත්‍රලාභියකු හෝ බලපත්‍රයක් ලබාගැනීමෙන් නිදහස් කර ඇති යම් තැනැත්තකු නිසි පරිදි බලය පවරන ලද සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු මගින් පෙනී සිටිය හැකි ය.

8. විදුලි පරීක්ෂකවරයකු විසින් පවත්වනු ලබන සෝදිසිකිරීමක් සහ පරීක්ෂණයක් පිළිබඳ යම් වාර්තාවක් ඔහු විසින් සකස් කරනු ලැබ එම වාර්තාව සෝදිසි කිරීම සහ පරීක්ෂණය අවසන්වීමේ සිට දින දාහතරක (14) කාලයක් ඇතුළත කොමිෂන් සභාව වෙත භාරදෙනු ලැබිය යුතු ය.

9. වාර්තාව සකස් කිරීමේ දී විදුලි පරීක්ෂකවරයා විසින් පහත සඳහන් කරුණු එයට ඇතුළත් කරනු ලැබිය යුතු ය :-

(අ) පනතේ විධිවිධානවල යම් උල්ලංඝනයවීමක් සිදුවී ඇද්ද යන්න පිළිබඳව ;
(ආ) යම් උල්ලංඝනය වීමක් සිදුව ඇත්නම් එම උල්ලංඝනය වීමේ බලපෑම හෝ ස්වභාවය ;
(ඇ) විදුලි රැහැන් හෝ විදුලි පිරියත භාවිත කිරීම තහනම් කිරීම හෝ විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම හෝ සැපයුම තහනම් කිරීම ඇතුලුව මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගනු ලැබිය යුතු හදිසි පියවර පිළිබඳ නිර්දේශ ; සහ
(ඈ) දෝෂය නිවැරදි කිරීම සඳහා ගත යුතු ප්‍රතිකර්මමය පියවර.

10. කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිත පරිදි ඉල්ලීම කරනු ලබන පාරිභෝගිකයා වෙත හෝ බලපත්‍රලාභියා වෙත හෝ බලපත්‍රයක් ලබාගැනීමෙන් නිදහස් කර ඇති තැනැත්තා වෙත එම විදුලි පරීක්ෂකවරයාගේ වාර්තාව ලියාපදිංචි තැපෑලෙන් සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

11. අවස්ථාවෝචිත පරිදි පාරිභෝගිකයා, බලපත්‍රලාභියා හෝ බලපත්‍රයක් ලබාගැනීමෙන් නිදහස් කර ඇති තැනැත්තා 10 වන නියෝගය යටතේ තමා වෙත සන්නිවේදනය කරනු ලැබූ තීරණයක් මගින් අතෘප්තියට පත්වන අවස්ථාවක දී එම තීරණය පිළිබඳ තමා වෙත සන්නිවේදනය කරනු ලැබූ දින සිට දින දාහතරක කාලයක් ඇතුළත එකී තීරණයට එරෙහිව කොමිෂන් සභාව වෙත ලිඛිත සන්නිවේදනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

12. කොමිෂන් සභාව විසින් ආරවුල විසඳීම සඳහා එවැනි සෑම සන්නිවේදනයක්ම සමථ කිරීමේ මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබිය යුතු ය.

13. කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම රුපියල් දෙසීය පනහක (රු.250/-) ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

14. 13 වන නියෝගය යටතේ ගෙවනු ලැබිය යුතු ගාස්තුව "ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ" නමට මුදල් ඇණවුමක් හෝ බැංකු අණකරයක් මගින් ගෙවනු ලැබිය යුතු ය.

15. විදුලි පරීක්ෂක හෝ කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම නිවැරදි බවට තීරණය කළහොත්, 13 වන නියෝගයේ සඳහන් ගාස්තුව එම ඉල්ලීම කරනු ලබන තැනැත්තා වෙත ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

16. කොමිෂන් සභාව විසින් තමා වෙත යොමුකර ඇති ඉල්ලීම් ප්‍රමාණය, විදුලි පරීක්ෂකවරයා විසින් නිර්දේශ කරනු ලැබූ ප්‍රතිකර්මමය පියවර හා ක්‍රියාත්මක වී ඇති ඔහුගේ නිර්දේශවල බලපෑම පිළිබඳ තොරතුරු ඇතුලත්ව යම් ලිත් වර්ෂයක් (මෙහි මින් මතු "මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසන් වීමෙන් එක් මාසයක කාලයක් ඇතුළත, එම වර්ෂය තුළ දී විදුලි පරීක්ෂකවරයා විසින් සිදුකළ කාර්යය සාධනය පිළිබඳ විස්තර නිශ්චිතව දක්වමින් වාර්ෂික වාර්තාවක් පිළියෙල කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

17. විදුලි පරීක්ෂකවරුන්ගේ ක්‍රියාකාරකම් විගණනය කිරීම කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන යම් කාලයන් තුළ දී සිදුකළ යුතු අතර ක්‍රියාකාරකම් විගණනය කිරීම අවම වශයෙන් එක් මුදල් වර්ෂයක් තුළ එක් වරක් හෝ සිදු කරනු ලැබිය යුතු ය.

18. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස :-

"පනත" යන්නෙන් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අදහස් වේ ; සහ

"කොමිෂන් සභාව" යන්නෙන් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ මහජන උපයෝගීතා කොමිෂන් සභාව අදහස් වේ.

19. 2014.10.10 දිනැති අංක 1883/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2014 අංක 01 දරන විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්ය, කර්තව්‍ය හා කාර්ය පටිපාටි) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

06 - 599

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.